# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 ජුනි මස 28 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.07.03 දින නිකුත් කරන ලදී)

## නිවාඩු (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**1971 අංක 29 දරන නිවාඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී  ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 | තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නිවාඩු (සංශෝධන)

### 1971 අංක 29 දරන නිවාඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක දරන නිවාඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1971 අංක 29 දරන නිවාඩු පනතට 14අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1971 අංක 29 දරන නිවාඩු පනතේ 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම පනත තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

> "14අ. පුර පසළොස්වක පොහොය දිනවල හෝ ඉරිදා දිනවල පස්වරු 3.00 දක්වා කාලය තුළ කිසියම් පරිශ්‍රයක හෝ ස්ථානයක් තුළ පාසල් යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපකාරක පන්ති පැවැත්වීම, පන්ති පැවැත්වීමට කටයුතු යෙදීම හෝ පහසුකම් සැපයීම කිසිවකු විසින් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** පනතේ 17 වන වගන්තියේ "රුපියල් දහසක්" යන වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් දස දහසක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.